සන්න සහිත.

# දහම් ගැටේ.

අච්චු ගසන් නට යෙදු නේ

වර්‍ෂ 1887 තේ අප්‍රේල් මස විසි ප ස්

වෙනි දින දිය.

ශ්‍රී බු 2429.

# දහම් ගැටය.

1 සෙනලෙස නොවියතුන් වියතුන් ඉස්සලසලා
සොයනෙව්අරුතුතෙපුල් සවණිම්ණෙව්දහම්ගැට.

(ශබ්දශාස්ත්‍රබහුශ්‍රැතාදියෙන්) නොවියතුන්, අව්‍යක්තයන්; සෙනලෙස, හාස්‍යකරණලෙසටද (නිඝණ්ටු ව්‍යාකරණ ඡන්දස්ලක්ෂණ බහුශ්‍රැත සියලු ශාස්ත්‍රයෙහි නිෂ්පත්තිප්‍රාප්ත) වියතුන්, ව්‍යක්තයන්; ඉස්සලසලා, ශීඝ්‍රවලනයකොට ප්‍රශංසාකරණලෙසටද; අරුතුතෙපුල්, අර්ථවචනයන්; සොයනෙව්, පරීක්ෂාකරණමෙන්; සවණිම්ණෙව්, කර්ණාලංකාරමණිකුණ්ඩලාභරණයකටබඳුවූ; දහම්ගැට, ධර්මග්‍රන්ථිනම්වූ ප්‍රබන්ධයක්.

2 සාවකසඳින්ගෙණ පාදම් අටක්ගැටලා
සතරපාහිසලා එමපාදම්න් බැඳ පවිම් අද.

සාවක, ශ්‍රාවකයන්ගේ; සඳින්, චිත්තයෙන්; ගෙණ, ග්‍රහණයකොට; පාදම්, පාළිධර්මනැමති; අටක්, මුක්තාහාරයක්; ගැටලා, ග්‍රීවයෙහිබන්‍ධා; සතරපා, සර්වඥයන්ගේශ්‍රීපාදය; හිසලා, උත්තමාංගයෙහි පිහිටුවා එමපාදමින්බැඳ, එමසර්වඥයන්ගේ පාළිධර්මයෙන්රචනාකොට; අද, අමුතුව; පවිම්, ප්‍රකාශකෙරෙම්.

3 මී අඹ සක්කරා බඹරා සඳපානකා
ගවයන් බණමහණසවණ දෙව්ලෝඅනත්සුවදෙ.

මීඅඹ, මහීකාන්තාය; සක්කරා, ශක්‍රයාය; බඹරා; බ්‍රහ්මයාය; සඳපාන, චන්ද්‍රයාය; කා, ආකාසය; ගවයන්, ඊශ්වරයාය; බණ, ධර්මය; මහණ, ශ්‍රමණය; සවණ, සර්වඥය; (යනමේ) දෙව්, දේවසමූහතෙම; ලෝ, ලෝකයාහට; අනත්සුවදේ, අනන්ත.වූ ඓශ්වර්‍ය්‍ය ප්‍රදානය කෙරේ.

4 සඳුන්සුනුපලෙල ගියමී අඹකකාරා
කිර්දමෝරුගෙණ වදුරුනැගිදූරියන්සරණගව්.

සඳුන්, අහනාවන්ද; සුනු, චුනුයන්ද; පල්, මස්ද; ලේ, රුධිරද; ගිය, වාහනද; කිරි, ඇතුන්ද; මීඅඹ, මකීකාන්තාව, කකාරා, ගුගුරුවා හෙවත් සුශික්ෂිත කොට; දී, පරිත්‍යාගකොට; මෝරුගෙණ, ගිරිමෙඛලා නැගි ආ මරඝුපුලයකොට; වදුරුනැගි, වජ්‍රාසනාරූඪවූ; දූරියන්, ධෛර්‍ය්‍යයන්; සරණයව්, සරණගත වව්.

5 මිහවිසනසලා පිළුවුන්මැඩවලදමා
සඳුන්පැන්වත්කොට දීවලදූවදුරුනැංගේ·

මහව්, මහපෘථිවිය; සන, සත්වාරයන්; සලා, චලිතකොට; පිළුවුන්, පැටවුන්හෙවත් දරුවන්; මැඩ, මර්දනයකොට නොහොත් මලානිකකොට; වල, ආරණ්‍යයෙහිදී; දමා, පරිත්‍යාගකොට; සඳුන්, අඟනාවන්ද; පැන්වත්කොටදී, හස්තොදකයෙන් පරිත්‍යාගකොටදී; වලදූ, දූනමුඛප්‍රාප්ත කොටදී; වදුරුනැංගේ, වජ්‍රාසනාරූඪවූ.

6 තපසිවරිනි දූත්සහසාතණ මරත්නේ
දෙකෙතහෙළිකොටගෙණ සැබෝමතුකොටත්තේ

තපසිවරිනි, තපොනිශ්‍රිතයෙනි; දූත්, ධ්‍යානසමාතියෙන්; සහසා, සාහසිකව; තණමරත්නේ, තෘෂ්ණාච්ඡේදනයකොට විනාශකරන්නේය; දෙකෙත, දෙහක්ෂුය; හෙළිකොටගෙණ, ශුද්ධකොටගෙණ; සැබෝ, චෛත්‍යයන්හා බොධිද්‍රැමයන්; මතු, අනාගතකාලයෙහි; කොටත්තේ, කොටගන්නේය

7 කබලනොබිදෙනතුරු ලූ ඇලාඅද තිබූනම්
කබලබූනෝතිබූත් ලූණුනොතසීසෙටවිනතුරු.

කබලනොබිඳෙනතුරු, කායබන්‍ධ නොනස්නාතෙක්; අද, චිත්තයෙහි; ලුණුලාභිබූනම්, කරුණාසංශීතළානම්; කබලබුනෝතිහුත්, කායබලහග්නාවුවත්; සෙටවනතුරු, ශ්‍රෙෂ්ඨභාවයට පැමිනෙනතුරු; ලුණුනොනසී, කරුණාව හානිනොවේ.

8 නොලදින්දූන්කසා සමණන්සොයනදූරියන්
සඳුන්සුනුතබා නොබා යත්නත් කසාවතාට.

දූන්,මේකාලයෙහි; කසානොලදින්,කාෂායවස්ත්‍රය නොලදුනම්; සමණන්සොයනා, ශ්‍රමණභාවයඑෂණ කරන්නාවූ; දූරියන්, ධෛර්‍ය්‍යීයන්විසින්; සඳුන්, අගනාවන්ද; සුනු,සුත්‍රයන්ද; තබා, හැර; නොබා,සංසාරභිතියක්නැතිව; කසාවත්තට, කාෂායවස්ත්‍රයට; යත්නේ, ප්‍රයාණය කරන්නේයී

9 ඉස්සන්සොයාගොස්සැහැසීරණටනොලදින්
දළපිසපඤ්ඤපොවා මගදිරාකලයෙන්හැරපී

සැහැසී, ශාක්‍යසිංහතෙම; රණට, ආරණ්‍යයට; ඉස්සන්, ඉසිවරයන්; සොයා, එෂණයකොටගොස්; ප්‍රයාණයකොට; නොලදීන්,ඔවුන්ගේ දුලීබධීන්ද;දළජටාද; පිස, තුච්ඡකොට; පඤ්ඤපොවා, ප්‍රඥතුහවකරවා; මගදී, මාගීශුනාදූනයකොට; කාලුයෙන්, කායචිත්තයෙන්;රා,කෙලෙශයන්;හැරපී, විප්‍රකාරකෙළෙයී.

10 අරේපිබිදගොස් දූසක් දමා ඉස්සන්
රත්දී රිදී ගෙණ එමඉස්සන්ඉසපිසී.

අරේ, ආර්‍ය්‍යතෙම; පිබිදගොස්, ප්‍රබොධව ගොස්හෙවත් ප්‍රව්‍රජ්‍යාව; දූසක්ඉස්සන්, සහස්‍රප්‍රමාණඉසිවරයන්; දමා, දමනයකොට; රත්දී, ආරණ්‍යයෙහිදී; රිදීගෙණ, සෑඩිලුපදවා; එමඉස්සන්, එමසෘෂිවරයන්; ඉසපිසී, ඉසමුදුලී.

11 සමණන්දූකකැකිර්පිසදී සතරපස්දූ
නිවන්යනදූරියෝ තවත්සමණන්ටමදිවිපුදත්

නිවන්යනදූරියෝ, මොක්ෂප්‍රවේශවන්නාවූ ධෛර්‍ය්‍යසීයෝ; සමණන්දූක, ශ්‍රමණයන් නිරීක්ෂණයකොට; කැකිර්පිස, කර්කශභාවය අත්හැරදමා; සතරපස්දූ, චතුර්විධප්‍රත්‍යයදානයන්දී; තවත්, නැවතත්; සමණන්ටම, ශ්‍රමණයන්ටම; දිවිපුදත්, ජීවිතයපූජාකෙරෙත්.

12 තණදූවලටගොස් අඹරාගණුවපාදම්
කුණුඅමුඩුගලවා මොරපූ දූරියෙනි නිවන්යව්.

තණදූ, තෘෂ්ණාච්ඡේදනයකොට; වලටගොස්, අරණ්‍යයට ප්‍රවිෂ්ටව; (නැවත) අඹරාගණුව පාදම්, ධර්‍මයග්‍රහණයකරණු; කුණුඅමුඩුගලවා, උකුණුකෙස්වැටිය ගලවාහැර; මොරපූ, මෝහරාගයහැර කුසලය මුහුකුරුවාගත්; දූරියෙනි, ධෛර්‍ය්‍යසීයෙනි; නිවන්යව්, නිර්වාණප්‍රාප්තවව්.

13 රාකලයෙන්ගෙණඉස්සන්ඇතිලියේලා
ඇමරාපිසදීනොයීදවල්ගොස්සාවුන්ගන්නේ.

ඇම, සකලසත්වයන්; රාපිසදී, කෙලෙසයන් ප්‍රහාණකොටදී; කලයෙන්, කායචිත්තයෙන්; ගෙණ, කෙලෙසග්‍රහණය කොට; ඉස්සන්, ඉසිවරයන්; ඇතිලියේලා, අභ්‍යන්තරයෙහි බහාගෙණ; නොයීද, නිසද්‍ය නොකොට; වල්ගොස්, අරණ්‍යයටප්‍රවිෂ්ටව; සාවුන් ගන්නේ, ශ්‍රාවකයන් ග්‍රහණයකරන්නේ.

14 ලූණුදියඉසලාප ල්වල්සඳුන්සූනුහෙලා
ත්‍රිකනාරාම්දී මූදවාබුදුගත්තෝ.

දිය, ලෙව්හි; බුදුගත්තෝ, බෝධිඥානය සමහිත නාරණුවෝ; ලූණුලා, කරුණාවබහා; හිස, මස්තක

යද; පල්, මස්ද; ලේ, රුධිරයද; සඳුන්, ප්‍රියාවන්ද; ඥා
ති, පුත්‍රයන්ද; හෙලකිරි, ශ්වෙතහස්තීන්ද; මිනකා
රා, මණිකම්පාකරවා; දී, දානයකොට; මුදවා, සංසාර
චාරිත්‍රිය මුක්තකරන්නෝයි

15 වැරසැරපිම්යෙක් තෙමේපූවල්ගොස්සිට
සතක්තැනිගෙන්වාඑකැතිනිසත්වත්තඉදිකෙළෙ.

තෙමේද, නෙමියජනකයෙහිදී වල්ගොස්සිට, වනප්‍ර
විෂ්ටව; සතක්තැතිගෙන්වා, පරිවාරක්ෂත්‍රියයන් ස
ත්දෙනකුගෙන්වා; එකැතිනි, ඒකාන්තයෙන්; සත්
වත්ත, ඒ සත්වස්තු; ඉදිකෙළෙ, ඉඩකෙළේ; වැරසැ
රපිරිම්යෙක්, වීරසාරපුරුෂයෙකි.

16 ඉසසන්සොයන්නන්ලුණුලාඅදඉසිපතුබොන්නෝ
අඩවැද සතුන්විද වටනාකා නිවන්යන්නෝ

ඉසසන්, ඊෂ්‍යාවන්: සොයන්නන්, ගරිනනාවූත්වි
සින්; අදලුණුලා, සිත්හිකුලුණුබහා; ඉසිපතුබොන්
නෝ, ඊෂ්‍යාප්‍රහගනාය කරන්නේය; අඩවැදසතුන්වි
ද: ආරණ්‍යප්‍රවිෂ්ටව සත්‍යාවබොධකොට; වටනාකා,
ත්‍රිවර්ගසම්පත්තීන්වළඳ; නිවන්යන්නෝ, නිර්වාණප්‍රවි
ෂ්ටවන්නෝයි.

17 නොසලා එද දුන් පිටියෙන් පුපිසුයෙන්
සසින්සිට සද්දදී අවගළ සතරමස්සක්.

සතර, ශාස්තෘතෙම; එද, ඒ මාරයුද්ධ දිනයෙහි;
නොසලා, නිශ්චලව; දුන්පිටියෙන්, දුන්නාවූපෘෂ්ඨ
යෙන් හෙවත් දුන්නාවූපිටුවහලින්; පුප්සුයෙන්, පූර්
ජාතිඅළගෙයින්, සද්දසගින්සිට, සජ්ජාහසක් නිරා
හාරවසිට; මස්සන්දී, මාංසචක්ෂූදානයකොට; අවග
ළු, දීනාතික්‍රාන්තකෙළෙයි.

18 පුපිසතබාලා බණගෙටගොස් සයින්ඉඳ
දම්මා දම්සඟුණබලා සද්දවසකින් නිමවූ.

පුපිසතබාලා, පූර්ජතිශූන්‍යකොටතබා; බණගෙටගොස්, ධර්මරත්න ගෘහයටප්‍රවිෂ්ටව; සයින්හිඳ; නිරාහාරයෙන්හිඳ; දම්මා, ධර්මස්වාමිතෙම; දම්සඟුණ, ධර්මසඟණීකාව; බලා, ස්මරණයකොට; සත්දවසකින්, සප්තාහයකින්; නිමවූ, නිෂ්ඨාකළෝ.

19 ආදිදූරිඇත්තෙන් අඹුවන්මරා ලුහුබැඳ
අදපාමුලසයින් සද්දූළුන්නු සමණෝ.

දූරි, ධෛර්‍යවත්වූ; සමණෝ, ශ්‍රමණයෝ; ආදි, පූර්ජතියෙහි; දූරිඇත්තෙන්, ධෛර්‍යඇතිහෙයින් හෙවත් බුදුවූහෙයින්; මරාඅඹුවන්, මාරාංගනාවන්; ලුහුබැඳ, පලවා; අදපාමුල, අජපාල නිග්‍රොධමූලයෙහි; සයින්, නිරාහාරයෙන්; සද්දූළුන්නු, සතිශක් වාසයකළෝ.

20 දූන්පුහුදුන්නේ නරකයලැබෙත් එත්
සැබැවියනොලබන්නේ නරකය පුහුදුන්නේ.

දූන්, වේකාලයෙහි; පුහුදුන්නේ, පෘථග්ජනයෝ; එත්, අනාගතයෙහි; නරකය, අපාය නොහොත්ම නුෂ්‍යත්වය; ලැබෙත්, ලබද්දවෙති, පුහුදුන්නන්, පෘථග්ජනනොවන්නේ; නරකය, අපාය නොහොත්මනුෂ්‍යත්වයහෝ; නොලබන්නේ සැබවිය, අලබදවන්නේ ඒකාන්තයි.

21 මසමණෝ දූරිඇත්තෝ මමදූරිනැත්තෙමි
නොපබෙලෙනිමතුනැණට මාදූරිඇතිවන්නේ

මසමණෝ, මාගේශ්‍රමණයෝ හෙවත් ගෞතමශිෂ්‍යවරයෝ; දූරිඇත්තෝ, ධෛර්‍යඇත්තෝය; මම දූරිනැත්තෙමි, මම වනාහි ධෛර්‍යශූන්‍යයෙමි; (ඒ

හෙයින්) නැණට, ඤාණක්ෂයට හෙවත් ප්‍රඥාපාරමිතාවට: මතු, අනාගතයෙහි; මාදුරිඇතිවන්නේ, මාගේධෛර්‍ය්‍යඇතිවන්නේ; තොපබෙලෙනි, තොපගේ සහායෙනි.

22 දුරිඇතිවීම්නම්නැණහා එකගයෙම්නම්
සමණන්ඇසිදමට දුන් රාපලාවක්ලදිම්නම්

දුරිඇතිවීම්නම්, ධෛර්‍ය්‍යවත්තාවීම්නම්; නැණහා, ප්‍රඥාවසමග; එකගයෙම්නම්, එකමාර්ගයකප්‍රයාණය කෙරෙම්නම්; රාපලා, කෙලෙශච්ඡේදනය කොට; දුන්, ධනනයෙන්යුක්තවූ; වක්ලදිම්නම්, චිත්තයක් ලද්දෙම්නම්; මට සමණන්ඇසිද, මට ශ්‍රමණයන් ගෙන් කම් කිමිද

23 තවඑතරනොගියෙමි මසමණෙනිමාතියෙනි
සතරවනමගලේ සරණදීමාඑතර ලන්නේ.

තවඑතරනොගියෙමි, මේකාලයදක්වා සංසාරසාගරයෙන්එගොඩ නොපැමිනියෙමි; මසමණෙනි, මහාශ්‍රමණයෙනි; මානියෙනි, මාගේප්‍රභුවෙනි;(එහෙයින්) සතරවනමගලේ, ශාසනාගුළපදනා මගලයයෙහි; සරණදී, ප්‍රතිෂ්ඨාදායකව; මාඑතරලන්නේ, සංසාරසාගරයෙන් මා පාරප්‍රාප්ත කරන්නේයි.

24 බවානුමුත් මගනැණ දක්නාතෙක්
මොරපුකලදෙව එතරවන්නටසිතමු සෙත්සුබ.

සෙත්සුබ,ශාන්තියෙක්පැමිනියේනම්; බවානමුත්, භාවනායෙන් අමුක්තව; මගනැණ, මාර්ගඥානය, දක්නාතෙක්, දර්ශනයකරණතුරා; මොරපු, මොහරාගයෙන් බාධකවූ; කල, කායචිත්තය; දෙව, පරිශුද්ධකොට; එතරවන්නට, සංසාරසාගරයෙන් මුක්තවන්නට; සිතමු, ප්‍රාර්ථනා කරමු.

25 කාබ්වා වල්ගොස්සතුන් විදසම්හැරගණ
මගවුවාපලා දකුගොස් වනපියානන්.

කාබවා, කායගතාසති භාවනාකොට; වල්ගොස්, වනප්‍රවිෂ්ටව; සතුන්විද, සත්‍යාවබොධනයකොට; සම්හැරගෙණ, සමථයග්‍රහණයකොට; මගමුවාපලා, මාර්ගඥානයට ඇතුළුව; වනපියානන්, පද්‍යබන්ධනය කළාවූ ජිතුහු; ගොස්, ගමනයකොට; දකු, දර්ශනය කරව්.

26 දරසොයා නොයව් සතුසොයාවලටයව්
තම්පලාකඩව් නෑණනිත්තෙන් පූපිසව්.

දරසොයානොයව්, දූරාවන් එෂණයකොට නොයව්; සතුසොයා, චතුස්සත්‍යයන් එෂණයකොට; වලටයව්, වනප්‍රවිෂ්ටවව්; තම්පලා, මොහය දුරුකොට නොහොත් අඩ්නොකට; කඩව්; ඡෙදනයකරව්; නෑණ, ඥානවන්තයෙනි; නිත්තෙන්, නිරන්තරයෙන්; (අනිත්‍යාදී, තිලකුණු භාවනායෙන්;) පූ, පූර්වජාතිය, පිසව්, තුච්ඡකරව්.

27 දරසොයනදූරියෙනි කටුදරනොඅල්ලන්නේ
පැලිදරසොයනේපැලිදරබෙලෙනිපූපිසන්නේ.

දරසොයනදූරියෙනි, දූරාවන් ඒෂණය කරන්නාවූ ධෛර්‍යවන්තයෙනි; කටුදරනොඅලලන්නේ, තක්ෂදූරාවන් ඒෂණයනොකරන්නේය; පැලිදරසොයන්නේ, ව්‍යක්තවූදූරාවන් ඒෂණයකරන්නේය; පැලිදරබෙලෙනි, ව්‍යක්තවූදූරාවන්ගේ අනුබලයෙන්; පූපිසන්නේ, පූර්වජාතීන් තුච්ඡකරන්නේයි.

28 වදුරුනැගෙන්නට අනුමැතියෝ පළමුදු
සන්සුනුපැත්දී තිරිමුදත් මීනකාරත්.

දනුමැතියෝ, ඥානවන්තයෝ; විදුරු නැගෙන්න ඬ, වජ්‍රාසනාරූඪවන්නට; පළමුදු, ප්‍රථමජාතියෙහි; සක්, ඇසද; සුනු, දරුවන්ද; සඳුන්, අඟනාවන්ද; කිරිදු, භස්නීන්ද; මීකකාරා, මිශ්‍රීගර්ජනාකරවා: පැන්දී, හස්තොදක පරිත්‍යාගයෙන්, සම්නේදූන; මුද ත්; සම්මොචනයකෙරෙත්.

29 රන්දීපන්සිල්ගෙණ දුරිඇතිමෝරාදෙසි
පැණකඩාකාගිසීනෙන් මගපලාබව්දන්ව.

රන්දී, ආරණ්‍යයෙහිදී; පන්සිල්ගෙණ, පංචශීලග්‍රහණයකොට, දුරිඇති, ධෛර්‍ය්‍යඇති: මෝ, මෝහයද; රා, රාගයද; දෙසි, ද්වේෂයද; පැණ, ප්‍රඥාවෙන්; කඩා, ඡේදනයකොට; කාගිසීනෙන්, කායගතාසතිසූණයෙන්; මගපලා, මාර්ගඵලගතව; බව්, අවතීර්ණවූභාවය; දන්ව, බොධනයකර.

30 නියඹරා මල්සමයට හැමදූරියෝ දූම්දුවෙත්.
කැකිරිදළුකඩත් කුරසාමුලයෙන්උපුටත්.

නියඹරා, නිම්බුරාගය; මල්සමයට, මලානිකාවූකාලයට; හැමදූරියෝ, හැමධීරයෝ; දූම්දුවෙත්, ජාතියෙන්මුක්තවූවෝවෙත්; (එසේවූකල්හි) කැකිරි, තීක්‍ෂණභාවය; දළුකඩත්, දල්හබ ඡේදනයකෙරෙත්; කුර, ක්‍රූරභාවය; සාමුලයෙන්, සර්වාකාරයෙන්; උපුටත්, උත්පාටනයකෙරෙත්.

31 දිව්යානොයනතුරු වල්පතගණුවිඉඳුරා
පලාගියනමුත් දිවිසම වරදිබවාතර්වා.

දිව්යානොයනතුරු, කාණකාවිජ්ජොපමාවූ ජීවිතය අතික්‍රාන්තනොවනතෙක්; වල්පත, වනප්‍රවිෂ්ටව; ඉඳුරාගණුව, ඉන්ද්‍රිය ග්‍රහණයකොට ගණුව; දිවි

ජීවිතය; පලාගියනමුත්, අතික්‍රාන්තවීනුමුත්; සම්ව
රදී, කාම්සම්පත්තියත්විරුඩය; බවා, භාවනාකර;
තරවා, තිරකැර.

32 තම්පලාකඩව් සිනටිව්ගෙණ වනාව්
තෙල්සොයාදිවව්කබලබිඳලානෑණනොමැසෙව්

නෑණ, සෑණයෙන්; තම්පලා, මෝහය දුරීකර
ණයකොට; කඩව්, ඡේදනයකරව්; සිනටි, සමෘතිව
ත්වඅෂ්ටිගතා සතිභාවනාව; ව්, ශුහුව; ගෙණ, ග්‍ර
හණයකොට; වනාව්, ව්‍යාපෘතකරව්; තෙල්සොයා,
සෙනාහයගැර; දිවව්, ධාවනයකරව්; කබලබිඳලා,
කායබලභග්නකොට; නොමැසෙව්, පශ්චාත්තාප
නොවව්

33 සෑසීපතාලත්නෑණ සමණන්ඉන්දදී
සරණෑතියෙම්අතිස පරසමණන්ඇයිදමට.

පතාලත්, ප්‍රාණිනාවෙත්ලත්; සෑසිසමණන්, ශා
ක්‍යසිංහශ්‍රමණයන්; ඉන්දදී, විද්‍යමානකල්හී; අතිස
සරණෑතියෙම්, අතිතෘදියප්‍රතිෂ්ඨාකොට ඇත්තෙ
මි; නෑණ, සෑණයට; මටපරසමණන් ඇයිද, එසේ
වුමටබාහිරපාෂාඩයන්ගෙන් කම්කිම්ද.

34 සමණෝකිපෙත්නම් තවනම්කෙසේසනාහම්
සමණෝදත්තුනම්වැද්දනොමදෙතිකසාවත්තට.

සමණෝ, මාගේශ්‍රමණයෝ; කිපෙත්නම්, කෝ
පිවෙත්නම් එසේකල්හි; තවනම් කෙසේසනාහම්;
තව කෙසේනම් සෙනහකෙරෙම්ද; සමණෝදත්තු
නම්, තාගේ ශ්‍රමණයෝ දෘෂ්ටිගතපරිස්කාරාදීන් ද
ත්තුනම්; කසාවත්තට, කාසායවස්ත්‍රයට; වැද්දනො
මදෙති, ප්‍රවිෂ්ටවියනොදෙත්.

35 තපසීවරිනි දූත් සීනැටිවීවතාලා
සමගවලදත්තේ අතිසැදූපිස සතරසත්තෙන්.

තපසීවරිනි, තපොභූවරිනි; දුන්සිත, ධ්‍යනාසම්‍ය නිශ්‍රයෙන්; ඇටි, අෂ්ටිගතාසජ්; චී, ශුභුව; වනාලා, වනපතනකොටලා; අනිසැ, අනිතතදියෙන්; පූජිස, පූඵජිතීන්හැර; සතරසත්තෙන්, චතුරායිසත්‍යයෙන්; සම්ග, සවනීයවුමාගීඵලය; වලදන්නේ, අනුභවකරන් නේයි.

36 පල්පලාදෙන්නේ සකසාබත්බලාලා
එදුඅගනැංගේ මෙදුසාදු මරුන්බුන්නේ.

සාදු, සසජාතියෙහිදී; සක, ශකුයාගේ; සාබත් බලාලා, ක්ෂුධාතුක්ෂියදූක; පල්පලාදෙන්නේ, මාංස පලහා දුනපරිත්‍යාගකරන්නේ; එදු, ඒ ජාතියෙහි; අගනැංගේ, වහනිමසතකාරුණ්ව්‍ය; මෙදු, මේජාති යෙහි; මරුන්සාදු, පස්මරුන්ජයගෙණ; බුන්නේ, කෙලෙශයන් හගනකෙළෙයි.

37 දියපිටඉසසන් යන්නාදූක දනාමින්
දමාදළබිලිසාවක ගත්තන් දනුමෙදියේ.

දියපිට, ජගතමසනක යෙහි; ඉසසන්යන්නාදූක, සංෂීවරයන් ප්‍රයාණයකරන්නාදූක, මින්, ප්‍රභුව; දනා, උපදවා; බිලි, බලිවූ; දළදමා, ග්‍රන්ථධූරය හැර; සාවකගත්තන්, ශ්‍රාවකබැව් ගත්තවුන්; මෙදියේ, මේලොකයෙහි; දනු, අවබොධකරව්; හෙවත් තෙපිද ඔවුන්සේම ශ්‍රාවකපාරමිතා පූරව්.

38 කරවටුනොගොඅ දුමකණකොස්ලූනම්
අඹාමගපලාගෙණමෝරාගියකියන්නෙම්කියටී.

කාරාවට, කාකීශභාවයට; නොගොස්, නොපැමිණ; කණ, කණ්ණයෙහි; දුමකොස්ලූනම්, ධර්මසම්පත්තියබහාලූනම්; අඹා, වහා; මගපලාගෙණ, මාර්ගඵලග්‍රහණයකොට; මෝරාගිය, මොහරාග තිගීත

කල්හී; නියවිනියන්නෙමි, නියයුක්තාක්නියම් හෙ
වත් පාළිධම්මයෙන් භික්ෂු ප්‍රතිලාභයටපැමිනි යෙ
මියේයි.

39 සිවෑසෙසනිපතව් නරකයසරාකාලේ
සතරපසසාවකගෙණමස්පිසන්නේනරකයෙනි

සිවෑසෙසනි, සම්‍යකිසම්ප්‍රයුක්තව වසන්නෙනි; ස
රාකාලේ, බුඬොත්පාදකාලයෙහි; නරකයපතව්, ම
නුෂ්‍යතම භාවයප්‍රාණීනාකරව්; කරුණුතිමයත්, ස
තරපස්සාවකගෙණ, බුඬප්‍රත්‍යෙක බුඬ ශ්‍රාවකත්‍රය
ග්‍රහණයකොට; මස්පිසන්නේ, මාත්සර්‍යාදි ද්වේෂ
හරණේ; නරකයෙනි, මිනිස්බෑව්හි සිටයි.

40 නරකයපතන්තේ ලුණුලාබත්පිසන්තේ
ඉසිපණුබොන්තේ සුවදියෙනිසෙටබුදුවන්නේ.

නරකයපතන්නේ, මනුෂ්‍යතමය ප්‍රාණීනා කරන්
නේය; ලුණුලා, කුලුණුබහා; බත්පිසන්නේ, භක්
තිපොෂණයකරන්නේය; ඉසිපණු බොන්නේ, සාෂි
ප්‍රඥවෙන්ප්‍රයාණය කරන්නේය හෙවත් සීලසංරක්‍ෂ
ණාදියකරන්නේය; සුවදියෙනි, සැපදායකත්‍රිමෙ
න්; සෙට, ශ්‍රේෂ්ඨව (ත්‍රෛලොක්‍යාධිපතිව;) බුදුවන්
නේ, සම්‍යක්සම්බොධි සමධිගමය කරන්නේයි.

41 වලසුන්ඇරවගුත් දළබිඳසන්දමාලා
මගදිඑව්ගසමනැගීඅටලොස්කෙළක්පණුවන්.

වල, ආරණ්‍යයෙහිදි; අසුන්හැර, ආසනාරූඪව;
දමාසන්, ධම්මචක්‍රයෙන්; වගුන්දළබිඳලා, පචවර්ගී
යන්මානභන්නකොටලා; එව්ගසම, ඒක්‍ෂණයෙහි
ම; මගදී, මාර්ගඵලදානයකොට; අටලොස්කෙළක්
පණුවන්, අෂ්ටාදශකෝටියක් ප්‍රාණීන්; නැගී, සං
සාරසාගරයෙන් උත්තීර්ණකෙළෙයි.

42 දඹුකඩ තමාකා සතුරන්ටබත්දෙන්නේ,
මිහණුන්බවන්නේතනරන්වතිනිනිවන්යන්නේ.

දඹුකඩ, ධර්මයකඩනොකොට; තමාකා, ස්වකීය ධ්‍යානයෙහිඅනුභවකොට; සතුරන්ට, ශත්‍රූන්ට; බත්දෙන්නේ, භක්තිදානයකරන්නේය; මහණුන්, මහණදම්; බවන්නේ, වඩන්නේය; තනරන්වතිනි ආරණ්‍යව්‍රතකරණයෙන්; නිවන්යන්නේ, නිර්වාණ ස්ථානයට ප්‍රවිෂ්ටවන්නේයි.

43 ගුණගෙණපාපියා කලයේරාබීපියා
මසුරන්ඉසපියා නිවන්යන්නේතණදපියා.

ගුණගෙණ, ශීලාදිගුණයන් ග්‍රහණයකොට; කලයේ, කායචිත්තයෙහි; රා, රාගය; බීපියා, සුන්කොටපියා; මසුරන්ඉසපියා, මාත්සර්‍ය්‍යගුණයන් හෙවත් මසුරුගුණයන්දමා; තණදපියා, තෘෂ්ණාව ඡේදනය කොට; නිවන්යන්නේ, නිර්වාණප්‍රවෙසවන්නේ; පාපියා, පාපක්ෂයකොට පියායි සේයි.

44 දිරාලෙඩමළ සමණන්දුකසතොස්මින්
සැහැසීඑදදුරිගියේ එරාහුලලාපියවා.

සැහැසී, ශාක්‍යසිංහවූ; දුරි, ධීරතෙම; එද, ඒ දිනයෙහි, හෙවත් මහබිණික්මන්දවසෙහි, දිරා, ජරාවතීර්ණය; ලෙඩ, රොගාවතීර්ණය; මළ, මරණාවතීර්ණයඃසමණන්, ශ්‍රමණයසියන චතුර්විධවූ පූර්වනිමිත්ත; දුක, දර්ශනයකොට; සතොසමින්, සන්තොෂවෙමින්; එරාහුලලාපියවා, එරාහුලකුමාරයන් හැර; ගියේ, ප්‍රයාණයකෙළේයි.

45 සවිලයන්ඇතැයි මහලටපටන්ගෙණලා
නැත්තෙන්සවිලයන් මගුල්තිබියේ එරාහුලලා

සව්ලයන්, සත්පුරුෂයන් හෙවත් සිඬාජී කුමාරයන්; ඇතැයි, විද්‍යමානයයි; මඟලට, ප්‍රසවමඟල්‍යයට; පටන්ගෙණලා, ප්‍රාරම්භකොටලා; සව්ලයන්නැත්තෙන්,සත්පුරුෂයන් අවිද්‍යමානහෙයින් හෙවත්මහබිණික්මන් කළහෙයින්; එරාහුලලා, ඒ රාහුලයන්ගේ; මගුල්තිබ්යේ, ප්‍රසවමඟල්‍යයට බාධාකෙළේයී.

46 සැහැසීකතුරුදියරසබීතුටුමුරුංගා
අවලකෙළිකෙළිඳු කැඹුවවතුඅත්තෙන්තම්පලා.

සැහැසී කතුරු, ශාක්‍යසිංහ කර්තෘහුගේ; දියරස, සෘධිරසය හෙවත් ප්‍රාතිහාර්‍ය්‍යනැමතිඅමෘතය; බී,අපානයකොට; තුටුමුරුංගා, දෙවියන් සිත් සන්තෝෂකරමින්; අවල, සම්පූර්ණව; කෙළිකෙළිඳු, ක්‍රීඩාකළඳිනයෙහි; වතුඅත්තෙන්, සිතින්සිත; තම්, මෝහඅන්ධකාරය; පලා,දුරුකොට; කැඹුව, ජේදනයකොට පියයි සේයී.

47 අඹුපිසදුමාලා සිල්කලයේපුරාගෙණ
නිවන්යනදූරියෙනි සතරබණවරකරඬුවෙලව්:

නිවන්යනදූරියෙනි. නිර්වාණයට යන්නාවූ ධෛර්‍ය්‍යඇත්තෙනි; අඹුපිස, ස්ත්‍රීන්හැර; දුම්ලා, ධ්‍යානයකොට; කලයේ, කායචිත්තයෙහි; සිල්පුරා, සීලසමාධ්‍යාදිගුණසම්පූර්ණකොට; සතරවර, උතුම්ශාස්තෘහුගේ; බණ, ධර්මය; කරඬුවේලව්, කර්ණයෙහි බහාපමුණුවව්.

48 මීදෙනදමාපි වස්සත්උනාපි
අමුඩුගලවාපි ගොපලුද්වගොස් ලොවළඳපී.

මීදෙනදමාපි, මහීධනයහැරපීය; වස්සත්, සංසා
රවැඞ්සන්; උනාපි, එතරකොටපීය; අමුඹුගලවාප්,
උකුණුකෙස්වැටියහැරපිය; ගොපළු, මහීපාලවූ එ
සිඬාර්ථකුමාරතෙම; දිවගොස්, මහබිනික්මන්කො
ට; ලොවළඳපි, නිවන්රස අනුභවකෙළේයි.

49 ඇදුරානැගුගෙයි දඬුපත් හැමවිදහැර
මඩුළුසුන්බුන්කොට තෙප්දුබුදුවන්නටතණදැවව්.

ඇදුරා, තෘෂ්ණානැමතිආචාරීහු; නැගුගෙයි, කළා
වූශරීරනැමතිගෘහයෙහි; දඬුපත්, කෙලෙශනැමතිගෘ
හොපකරණයන්; හැම, සර්වාකාරයෙන්; විදහැර,
විධ්වංසනයෙන් දුරුකොට; මඬුළු, කර්මනැමති ගෘ
හඝටයන්, (ප්‍රඥනැමතිපරසුවෙන්) සුන්බුන්කොට,
ශූන්‍යභග්නකොට; තෙපිදු, තොපිද; බුදුවන්නට,
සම්‍යක්සම්බුඬ වීමට; තණදවව්, තෘෂ්ණාච්ඡෙදනය
කරව්.

50 වදිම්තුන්ලෝනැතිනූපන් බුදුන්නොමියන
සතරඉරියව්වෙන් රුසිර්දී දම්දෙසූවන්.

නූපන්, මව්කුසින් ප්‍රසූතනොවූ; නොමියන, පිරි
ණිවන්නොයන; තුන්ලෝනැති, ත්‍රෛලොක්‍යයෙහි
අද්‍රෘශ්‍යවූ; සතරඉරියව්වෙන්, චතුර්විධ ඊර්ය්‍යා පථයෙ
න්; රුසිරිදී, ලෝකවාසීන්ට රුපශ්‍රිදර්ශනයකොට; දම්
දෙසූවන්, ධර්මදේශනාකළාවූ; බුදුන්, ඒ ආශ්චර්ය්‍ය
යන්; වදිම්, ප්‍රණාමණයකෙරෙම්; ඔහුකවර, නිර්මි
තබුදුහුයයි සේයි

51 ආදිමළසමණන් පසුවමළද ගෙණදවාපු
තවත්නොමළදූරියෝපතත්තුන්වනාවරම්යත්නත්.

ආදිමළ, ප්‍රථමබොධියෙහිදී; කෙලෙශයන් පරිනිර්වා
ණකළාවූ; සමණන්, මහා ශ්‍රමණයන් හෙවත් ගෞ

තමසර්වඥයන්; පසුවමළද, දෙවෙනිවසකනාඩපරිනි
ර්වාණයකළාවූකාලයෙහි; ගෙණ, ග්‍රහණයකොට; ද
වාපූ, ආදූහණ කළාහූය; නවත්නොමළ, දෙවනුව
ත්නොමළෝය; දූරියෝ, ධීරයෝ; තුන්වනවරමිය
න්නත්, තෘතීයපරිනිර්වාණයෙන් අන්තර්ධාන වන්
නවුන්; පතත්, දර්ශනයට ප්‍රාර්ථනා කෙරෙත්.

52 එකාසත්සෙනගක් එකඇතුපලාගියද
අඹාපසලදීගොසින් ලුණුබැදගත්තුවල්පත.

එක, අසහායවූ; ඇතුපලාගියද, හස්තිපාලයන්
හා අභිනිෂ්ක්‍රමණකළ දිනයෙහි; එකා, එපමණවූ;
සත්සෙනගක්, සත්රාජ්‍යක සත්සෙනගක්; ගො
සින්, ප්‍රයාණයකොට; පසලදී, ප්‍රාප්තස්ථානයෙදී නො
හොත් පර්ණශාලාවේදී; අඹා, එක්ව; ලුණුබැද, කු
ලුණු බැද; වල්පතගත්තු, අරණ්‍යප්‍රාප්තවූ.

53 මතුබලල්මස්මී වනපලාමල්ලා
බුදුවන්නොසැබවින්නවත්රත්නම්පලාදෙනුවන්.

මී, ප්‍රඥාවෙන්; තම්, මොහාන්ධකාරය; පලා, දුරු
කොට; වනපලා, වනප්‍රවිෂ්ටව; මතු, හිසද; බලල්,
පුත්‍රයන්ද; මස්, මාංසද; මල්, අඹුවන්ද; නවත්, නැ
වතත්; රත්, රුධිරද; දෙනුවන්, නෙත්‍රයන්ද; දී, ප
රිත්‍යාගකොට; බුදුවන්නේ, සර්වඥවන්නේ; සැබවි
න්, ඒ කානනයි.

54 සැසීසැසිදූරි සඳුද මැදපියාදත්
බැව්මෙනෙක්ද සතරවනදකැයකිරිබත්.

සැසිදූරි, ශාක්‍යසිංහධීරතෙම; සඳුද, ජන්දනනාජ
තකයෙහිදී; සැසි, සාහසිකව; දත්මැදපියා, දළකපා
දී; මෙනෙක්ද, මෙනෙක්ජාතියෙහි; බැවි, භාවනා
කොට, සතරවනද, සර්වඥවනජාතියෙහි; කිරිබත්
කැය, පායාසානුභවකළෝ

55 මෙවරමෙදෙකුඹුරේ කරතණපුරානැංගේ
සීනැවිනොනැංගේඑසිත්දමලනොලාහුන්නෙමි.

මෙවර, මෙසමයට; මෙ, මාගේ; දෙකුඹුරෙ, දෙ ගනැමතික්ෂෙත්‍රයෙහි; කර, කර්ෂවූ; තණ, තෘෂ් ණාව; පුරානැංගේ, සම්පූර්ණව උද්ගතවූය; සීනැවි, අශීඝ්‍රතාසම්මතිභාවනාව; නොනැංගේ, නොමහට ගත; එසිත්, ඒ අඥානකාරණයෙන්; දම, ධර්මයෙහි; ලනොලා, සිත්නොපිහිටුවා හෙවත් නිවන්හි සිත් නොලා: උන්නෙමි, සිටියෙමි හෙවත් සංසාරසාගර යෙහි රැඳුනෙමි.

56 තණගේවිදහැර බෝපාඅඩවියෙදී
සද්දමුලුල්ලේ එදූරි දවසැරි පලාකාලා.

එදූරි, ඒ ධීරතෙම; තණගේවිදහැර, තෘෂ්ණානැ මතිගෘහය විධ්වංසනයකොට; බෝපා අඩවියෙදී, බෝධිවෘක්ෂාරණ්‍යයෙහි නිසද්‍යකොට; සද්දමුලුල් ලේ, සප්තාහමාත්‍රයෙහි; පලාකාලා, නිවන්ඵලඅනු භවකොට; දවසැරි, දිනාතික්‍රමණයකළෝ

57 සුතුවතහැරපියා උපතමගහෙලාගෙණ
දූන්සතුටුවකොයිද නැණඹිනි දිවන්නේ.

සුතු, පුත්‍රසම්පත්තියද; වත, අනේකවස්තුන්ද; පි යා, ප්‍රියාවන්ද; හැර, දුරුකර; මග, මාර්ගඥානය; උ පතහෙලාගෙන, උත්පත්තිකොටගෙන; දූන්සතු ටුව, ධ්‍යානයෙන්සන්තුෂ්ටව; නැණඹිනි, ඥාණබ්‍ය යෙනි; දිවන්නේ, ධාවනයකරන්නේ; කොයිද, කො හිද; නිවණටයි.

58 අඳයටදෙමස්සක් පෙරදිලා මසමණෝ
දූන්සතරක්ලද්දු වරොරන්කෙළියට දූරියෙනි.

මසමණෝ, මහාශ්‍රමණයෝ; පෙර, පූර්වජාතියෙහි; අඳයට, අන්ධයාට; දෙමස්සක්දීලා, මසැස්දෙකක් දා නයකොටලා; දූන්, මේකාලයෙහි; සතරක්ලද්දු, ස ර්වඥබවක්ලැබූය; දූරියෙනි, ධීරයෙනි; රන්කෙළිය ටවරෝ, ආරණ්‍යයෙහි තපස්ක්‍රීඩාවට එව්.

59 කුදලාසමගගොස්සත්රජයෙකගොපොල්ලෝ
රන්දිර්දීගෙණ තවත්තණ්ඩු දූන්රජකළෝ.

කුදලාසමග, කුඳුලසමාගමයෙහි; සත්රජයෙක ගොපොල්ලෝ; සප්තරාජධානියක මහීපාලයෝ ගොස්, ප්‍රයාණයකොට; රන්දී, අරණ්‍යයෙහිදී; රිදී ගෙණ, සෑහීඋපදවා; තවත්, නැවතත්; තණ්ඩු, තෘෂ්ණාච්ඡේදනයකොට; දූන්රජක්ළෝ, ධනයෙන් රාජ්‍යය කළෝයි.

ධර්මසේනස්ථවිරයන් කළ

ධර්ම ගැට පදැසීය

නිමි.

# ශුද්ධපත්‍රය.

| පිටේ | පෙලේ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 3 | ශබ්ද | ශබ්ද |
| ,, | 10 | ග්‍රන්ථි | ග්‍රන්ථි |
| 2 | 22 | තෘෂ්ණා | තෘෂ්ණා |
| 4 | 11 | තෘෂ්ණා | තෘෂ්ණා |
| ,, | 16 | ප්‍රාප්ත | ප්‍රාප්ත |
| ,, | 20 | ගෙණ | රාගෙණ |
| ,, | 25 | වල් | ලේ |
| 6 | 4 | ගෘහයට | ගෘහයට |
| 8 | 11 | එණ | එෂණ |
| ,, | 15 | කෘත | කෘණ |
| 9 | 1 | කෘත | කෘණ |
| 12 | 10 | දෝෂ | දෝෂ |
| ,, | 23 | හැර | ඇර. |